# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2299/69 - 2022 සැප්තැම්බර් මස 30 වැනි සිකුරාදා - 2022.09.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත 27අ වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ වූ නියමය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනු ව්‍යවස්ථාව සමග කියවිය යුතු 1981 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත (විශේෂ විධිවිධාන) පනත මගින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 27 අ වගන්තියේ (4) වැනි උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සංචාරක හා ඉඩම් අමාත්‍ය හරින් ප්‍රනාන්දු වන මම,

(*අ*) 1979 අංක 69 දරන පනත මගින් පිහිටුවන ලද ජාතික තරුණ සේවා සභාව සතු කර ඇත්තා වූද, මෙම නියමයේ පළමු වන උපලේඛනයේ සවිස්තර ලෙස දක්වා ඇති හෙයියන්තුඩුව වත්ත යනුවෙන් හඳුන්වනු ලබන පහත සඳහන් කරනු ලබන ඉඩම හා සම්බන්ධව 1999 ඔක්තෝබර් 11 වැනි දින අංක 1101/2 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ඉහත කී පනතේ 27අ වගන්තියේ (2) වැනි උපවගන්තිය යටතේ සාදන ලද හෙයියන්තුඩුව වත්ත යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ඉඩමේ කොටසක් වන්නා වූ මෙහි දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ඉඩමේ බිම් ප්‍රමාණයට අදාළ නියමයන්වල කොටස්, එකී ජාතික තරුණ සේවා සභාව වෙත සතු කිරීම සඳහා වූ ප්‍රතිඥාවට අදාළ යම් යම් නියමයන් හෝ කොන්දේසියක් අනුව ක්‍රියාකර නොමැතිවීම හේතුවෙන් එහි නියමයන් ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම මගින් එම නියමයන් මෙයින් සංශෝධනය කරමි.

(*ආ*) එම ප්‍රත්‍යාදිෂ්ඨ කිරීමෙන් පසුව, එකී ඉඩම්වල බිම් ප්‍රමාණයන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත නැවත සතු කර දෙන බව මෙයින් ප්‍රකාශ කරමි.

**හරීන් ප්‍රනාන්දු,**
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2022 සැප්තැම්බර් මස 20 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය (ඉඩම්),
"මිහිකත මැදුර",
ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

1A - G 37676 — 09 (2022/09)
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## පළමුවන උපලේඛනය

### හෙයියන්තුඩුව වත්ත නමැති ඉඩමෙන් පවරාදුන් සම්පූර්ණ ප්‍රමාණය

| ගැසට් නිවේදන පිළිබඳ විස්තර | ඉඩමේ නම | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ජාතික තරුණ සේවා සභාව වෙත පවරන ලද ඉඩම් ප්‍රමාණය |
|---|---|---|---|---|
| අංක 1101/2 1999.10.11 | හෙයියන්තුඩුව වත්ත | ගම්පහ | බියගම | හෙක්. 10.0236<br>අක්කර 24 රූඩ් 3 පර්චස් 03 |
| | හෙයියන්තුඩුව වත්ත | ගම්පහ | බියගම | හෙක්. 0.6386<br>අක්කර 01 රූඩ් 2 පර්චස් 12.5 |

## දෙවන උපලේඛනය

| වෙන්කර දී ඇති විශේෂ්‍ය අංකය | ඉඩමේ නම | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ග්‍රාම නිලධාරි කොට්ඨාසය | කොමිෂන් සභාව වෙත නැවත සතුකර දෙන ඉඩම් ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| කො/28 | හෙයියන්තුඩුව වත්ත | ගම්පහ | බියගම | අංක 271 මාකොළ දකුණ | අංක 10532 දරන පිඹුරේ දක්වා ඇති කැබලි අංක 2A2 හි කොටසක්වන අක්කර 11 රූඩ් 0 පර්චස් 10 කින් (හෙක්ටයාර 4.4768) යුක්ත වූ ඉඩම් කොටස |

EOG 09 - 0369

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.